# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.07 පැය 0810 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/668 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

## 01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශ මාතර උප ඒකකය.

2025.04.06 වන දින රාත්‍රී කාලයේ මාතර පොලිස් වසමේ පොල්අතුමෝදර ප්‍රදේශයේදී පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශ මාතර උප ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 680 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන නිකවැරටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශ මහනුවර උප ඒකකය.

2025.04.06 වන දින දහවල් කාලයේ මාවනැල්ල පොලිස් වසමේ කිරිංගදෙනිය ප්‍රදේශයේදී පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශ මහනුවර උප ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 500 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන මාවනැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - මීරිගම පොලිස් වසම.

2025.04.06 වන දින රාත්‍රී කාලයේ මීරිගම පොලිස් වසමේ මීරිගම පස්යාල මාගර්යේ ඉදිපරපේ ප්‍රදේශයේදී මීරිගම දෙස සිට පස්යාල දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාගර්යේ පෙරලීගොස් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි කැබ් රථයක ගැටී අනතුරක් සිදුව ඇත.

අනතුරින් යතුරුපැදිකරු තුවාල ලබා මීරිගම රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 27 ක් වූ බොකලගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මීරිගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මීරිගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - තංගල්ල පොලිස් වසම.

2025.04.06 වන දින දහවල් කාලයේ තංගල්ල පොලිස් වසමේ තංගල්ල මාතර ප්‍රධාන මාගර්යේ කුඩාවැල්ල ප්‍රදේශයේදී දික්වැල්ල දෙස සිට තංගල්ල දෙසට ධාවනය වූ බස් රථයක් බස්නැවතුම්පලේ නතර කර නැවත ඉදිරියට ධාවනය කිරීමේදී එයින් බැස ගිය කාන්තාවක් මාගර්ය හරහා මාරුවීමට ගිය අවස්ථාවේදී එම බස් රථයටම යටවී අනතුරක් සිදුව ඇත. අනතුරින් කාන්තාව බරපතල තුවාල ලබා තංගල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 65 ක් වූ දික්වැල්ල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය තංගල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. තංගල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**